**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර I විභාගය - 2023 ජනවාරි

## යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජනවාරි

# (104) ව්‍යාපාරික පරිසරය

# යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 20 කි
(මුළු ලකුණු 40)

**A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:***

**1.1** (4)

**1.2** (3)

**1.3** (1)

**1.4** (1)

**1.5** (4)

**1.6** (3)

**1.7** (2)

**1.8** (1)

**1.9** (4)

**1.10** (3)

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 20)***

**1.11** අසත්‍යයි

**1.12** සත්‍යයි

**1.13** අසත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 10)***

**1.16.** දැක්ම යනු තම ව්‍යාපාරය පිළිබඳව එහි ප්‍රවර්ථකයා තුළ ඇතිවන සිහිනයයි. දැක්ම ව්‍යාපාරය, මෙහෙවර දෙසට යොමු කරයි. දැක්ම ගමනාන්තයක් නොවේ, නමුත් එය ව්‍යාපාරයට මග පෙන්වන සුවිශේෂී බලාපොරොත්තුවකි. මෙහෙවර/නිෂ්ඨාව යනු සංවිධානය අනෙකුත් තරගකරුවන්ගෙන් වෙනස් වන ආකාරය විස්තර කරන ප්‍රකාශයකි. එය ව්‍යාපාරයේ පැවැත්ම පැහැදිලි කරයි. දැක්ම නිවැරදි මග පෙන්වීම සපයන බැවින් ව්‍යාපාරයට මෙහෙවර සාක්ෂාත් කරගත හැකිය.

*(ලකුණු 02)*

**1.17. ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ (SMEs) කාර්යසාධනය ඉහළ නැංවීමේ ක්‍රම**

1 පරිසරය සක්‍රීය කිරීම

2 නවීන සුදුසු තාක්ෂණය

3 ව්‍යවසායකත්ව සංස්කෘතිය සහ නිපුණතා සංවර්ධනය

4 මුදල් සඳහා ප්‍රවේශය

5 වෙළෙඳපොළ පහසුකම් සැපයීම

6 පර්යේෂණ සහ සංවර්ධන

7 සම්පත් කාර්යක්ෂමතාව

8 කලාපීය සමතුලිතතාවය

*(ලකුණු 02)*

**1.18. පෝටර්ගේ පංච බලවේග විශ්ලේෂණය**

1 කර්මාන්තයට අලුතින් ප්‍රවේශවන්නන්ගෙන් සිදුවන තරගය

2 සැපයුම්කරුවන්ගේ කේවල් කිරීමේ බලය තුළින් ඇතිවන තරගය

3 පාරිභෝගිකයන්ගේ කේවල් කිරීමේ බලය තුළින් ඇතිවන තරගය

4 ආදේශක භාණ්ඩ හා සේව මගින් ඇතිකරන තරගය

5 කර්මාන්තයේ පවතින තරගකරුවන් අතර ඇති තරගය

*(ලකුණු 02)*

**1.19.** අභ්‍යන්තර ව්‍යවසායකත්වය යනු ව්‍යාපාරික ආයතනවල සේවකයින් නිර්මාණශීලීත්වය තුළින් උත්පාදනය කරන නවෝත්පාදනයන් ය. පවතින ව්‍යාපාරික ආයතනයක ප්‍රධාන තනතුරු දරන නිර්මාණශීලී පුද්ගලයින් බොහෝ විට ව්‍යාපාරයේ නිෂ්පාදන සහ නිෂ්පාදන දියුණු කිරීම සඳහා ඔවුන්ගේ නිර්මාණශීලී කුසලතා භාවිත කරන බැවින් ව්‍යාපාර අභ්‍යන්තරයෙන් ව්‍යවසායකත්වය පැන නගී. නිර්මාණශීලී පුද්ගලයින් ප්‍රධාන තනතුරු දරන විට සහ ඔවුන්ගේ නිර්මාණශීලිත්වය නවෝත්පාදනයන් බවට පරිවර්තනය කරන විට මෙය සංවිධානය තුළ මතු වේ.

*(ලකුණු 02)*

**1.20.** විවිධ රටවල් සහ විවිධ කතුවරුන් ව්‍යාපාරික සමාජ වගකීම පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇතත්, විශ්ව සම්මත වශයෙන් පිළිගත් අදහසක් නොමැත. ව්‍යාපාරික සමාජ වගකීම හි අර්ථය පිළිබඳ අර්ථකථන කිහිපයක් පහත සඳහන් වේ.

- සමස්ත සමාජයේ සහ ප්‍රාදේශීය ජනතාවගෙත් සේවකයින් හා ඔවුන්ගේ පවුල්වලත්, ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ සංවර්ධනයට දායක වන බවට හා සදාචාරාත්මකව හැසිරෙන බවට ඇප කැප වීම මෙවන් ව්‍යාපාරවල සමාජ වගකීමයි.
- ව්‍යාපාරවලට ඇත්තේ එක ම එක සමාජ වගකීමක් පමණි. එනම් රැවටීම් යන සාපරාධි වංචාවලින් තොර ව විවෘත හා නිදහස් තරගකාරී වෙළෙඳපොළ තුළ නිතිරීතිවලට අනුව රැඳී සිටිමින් ව්‍යාපාරයේ ලාභය වැඩි වන ආකාරයට සම්පත් භාවිත කරමින් කටයුතුවල නියුක්ත වීමයි.
- සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත් එමගින් සමාජයට ඇති වන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකව ම ව්‍යාපාර වගකීම සමාජ වගකීමයි.
- ජනතාව සඳහා ඉතා හොඳ ආර්ථික සංවර්ධනයක් උදා කිරීමට කැපවීම, සේවකයන්ට ගරු කිරීම, සේවක හැකියා වර්ධනය කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සහ සදාචාරාත්මක ව්‍යාපාරවල දියුණුවට සුදුසු ව්‍යාපාර රාමුවක් නිර්මාණය කිරීම සමාජ වගකීමයි.
- ව්‍යාපාර විසින් සමාජයට ආපසු දෙන දෑ සමාජ වගකීමයි.

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 40)***

SRI LANKA

***A කොටසෙහි අවසානය***

**(මුළු ලකුණු 40 යි)**

**B කොටස**

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 01 (II) - ව්‍යාපාර සංවිධාන***

**(a) සංස්ථාගත කිරීමේ සහතිකයෙහි අඩංගු වන තොරතුරු**

- සමාගමේ නම සහ අංකය
- සමාගම සංස්ථාගත කළ දිනය
- සමාගම සීමා සහිත සමාගමක්ද සීමා රහිත සමාගමක්ද ඇපයෙන් සීමිත සමාගමක් ද යන වග
- සමාගම පෞද්ගලික සමාගමක් ද යන වග
- සමාගම අක්වෙරළ සමාගමක් ද යන වග

***(ලකුණු 03)***

**(b) රටක ආර්ථිකයට සීමාසහිත සමාගමකින් ඇති වාසි**

1 දළ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලැබීම

2 රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් උත්පාදනය කිරීම

3 ආර්ථිකයේ (ගෝලීය ආර්ථිකය ඇතුළුව) තරගයට සාර්ථකව මුහුණ දිය හැකිය

4 නවීන තාක්ෂණය භාවිත කර එය රට තුළ ප්‍රවර්ධනය කළ හැකිය

5 කොටස් වෙළෙඳපොළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ ඒ ආශ්‍රිත ආයතන දියුණු කිරීමට උදව් කිරීම

6 කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි වන සංඛ්‍යාව වැඩි වීම තුළින් කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීම.

7 කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීමෙන් පොදු ජනතාවගේ ඉතිරිකිරීම් කොටස් වෙළෙඳපොළට ගලා ඒම හා ආර්ථිකය තුළ ඉතුරුම් වර්ධනය වීම.

***(ලකුණු 04)***

**(c) සමාගම් පනතේ 06 වගන්තිය අනුව නාමය පිළිබඳ නියමයන් පහත පරිදි වේ**

1 සෑම සීමාසහිත සමාගමකම නමේ මුලට ''සීමාසහිත'' යන වචන හෝ එහි කෙටි යෙදුම වන ''සී/ස'' යන්න යෙදිය යුතුය.

2 සෑම පෙද්ගලික සමාගමකම නමේ මුලට ''සීමාසහිත'' යන වචන හෝ එහි කෙටි යෙදුම වන ''සී/ස''යන්න සහ අගට යෙදෙන ''සමාගම'' යන වචනයට පූර්වයෙන් ''(පෞද්ගලික)'' යන වචනය හෝ එහි කෙටි යෙදුම වන ''(පෞද්)'' යන්න යෙදිය යුතුයි.

3 නිල ලැයිස්තුගත සමාගමක් වන සෑම සමාගමකම නමේ මුලට ''සීමාසහිත'' යන වචන හෝ එහි කෙටි යෙදුම වන ''සී/ස'' යන්න සහ ''සමාගම'' යන වචනයට පූර්වයෙන් ''(පොදු)'' යන වචනය යෙදිය යුතුයි.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 03 - ව්‍යාපාර උපකාරක සේවා |
|---|

**(a)**

1 මෝටර් රථ අනතුරු

2 ගින්න

3 ස්වභාවික විපත්

***(ලකුණු 02)***

**(b)**

**1. ව්‍යාපාර පාඩුවල අවිනිශ්චිතතාවය අඩු වේ.**

ව්‍යාපාරික ලෝකයේ විශාල දේපල ප්‍රමාණයක් යොදවා ඇත. විවිධ හේතූන් මත මෙම දේපලවලට හානි විය හැකිය. රක්ෂණ ඔප්පුවකින් හානිය අඩු කළ හැකිය.

**2. ව්‍යාපාර කාර්යක්ෂමතාව වැඩි කිරීම**

අලාභයේ අවිනිශ්චිතභාවය ව්‍යාපාරිකයන්ගේ මනසට අහිතකර ලෙස බලපෑ හැකිය. රක්ෂණය මගින් අවිනිශ්චිතතාවය ඉවත් කළ පසු ව්‍යාපාරිකයන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට උත්තේජනය කළ හැකිය.

**3. ව්‍යාපාර දායකත්වය**

කිසියම් හවුල්කරුවෙකුගේ මරණයේදී කිසියම් ව්‍යාපාරයක් නවතා දැමීමට සිදු වීය හැකිය. රක්ෂණය නිසා හවුල්කරුවෙකුගේ මරණයේදී ප්‍රමාණවත් අරමුදල් සපයයි. දේපල රක්ෂණයේ සහාය ඇතිව ව්‍යාපාරය දැවැන්ත ව්‍යසන තත්ත්වයන්ගෙන් හා පාඩුවලින් ආරක්ෂා කර ගත හැකිය.

**4. ණය ලබා ගැනීමට**

ව්‍යාපාරයට ණය ලබා ගැනීම සඳහා ඇපයක් ලෙස රක්ෂණ සහතිකය තබා ණයක් ලබා ගත හැක. රක්ෂිත පුද්ගලයන්ට ඔවුන්ගේ මරණයේදී අනිවාර්යයෙන්ම ගෙවීම නිසා වැඩි ණයක් ලැබේ.

**5. සේවක සුභසාධනය**

සේවකයින්ගේ සුභසාධනය සේවායෝජකයාගේ වගකීමකි. සේවක සේවිකාවන්ට රක්ෂණ පහසුකම් ලබාදීමෙන් ඔවුන්ගේ සුබසාධන පහසුකම් වැඩි දියුණු වේ. එය වැඩ සඳහා අභිප්‍රේරණය වැඩි කිරීමට හේතු වේ.

***(ලකුණු 04)***

**(c)**

1 භාණ්ඩ බෙදාහැරීමේ ප්‍රමාදය, එම නිසා පාරිභෝගික පදනම බිඳ වැටීම

2 අමතර ප්‍රවාහන වියදම්

3 අනතුරු සහ වන්දි

4 නිෂ්පාදන ක්‍රියාවලියට නියමිත වේලාවට ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාව

5 සේවකයින් ආයතන වෙත ප්‍රවාහනය කිරීමේ ප්‍රමාදය

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː

| |
|---|
| *පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම*<br>*පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම්, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්මවල ඇති වැදගත්කම* |

**(a)** ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට **[B2C]**

ව්‍යාපාරිකයා විසින් පාරිභෝගිකයෙකුට අන්තර්ජාලය හරහා සිදු කරන ඉලෙක්ට්‍රොනික වෙළඳාම් කටයුතු වේ. මෙය බොහෝ විට ඉලෙක්ට්‍රොනික් සිල්ලර වෙළඳාම (e-tailing) ලෙස ජනප්‍රියය.

උදා - කොළඹ සිට යාපනය දක්වා ගමන්ගන්නා දුම්රියේ ආසනයක් අන්තර්ජාලය හරහා වෙන්කරවා ගැනීම

*(ලකුණු 02)*

**(b)**

| පාරිභෝගිකයින් සඳහා විද්‍යුත් වෙළෙඳාමේ වාසි | පාරිභෝගිකයින් සඳහා විද්‍යුත් වෙළෙඳාමේ අවාසි |
|---|---|
| නිෂ්පාදන තෝරාගැනීමේ අවස්ථා පුළුල් කිරීම | භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීමට ඇති නොහැකියාව<br>පාරිභෝගික අවිශ්වාසය / ඉලෙක්ට්‍රොනික |
| ඇණවුම් කිරීමට පහසුය | විද්‍යුත් උපාංග සැකසීමේ මූලික පිරිවැය |
| කාලය සහ ශ්‍රමය ඉතිරි කිරීම/ අඩු කාලයක් ගත කිරීම | ගනුදෙනුවල ආරක්ෂාව පිළිබඳ නොදැනුවත්කම |
| නව අයිතම භාවිත කිරීමට අවස්ථාව උදා වීම | වෙළෙඳාම කෙරෙහි සෘණාත්මක ආකල්ප (පාරිභෝගිකයාට ඔහු හෝ ඇය ඇණවුම් කළ භාණ්ඩය ම ලැබෙනු ඇතැයි විශ්වාසභංග හැඟීමක් ඇත) |
| මුදල් ශේෂයන් ආපසු ගැනීමට සහ විද්‍යුත් මුදල් භාවිත කිරීමට අවශ්‍ය නොවීම | විද්‍යුත් උපාංග භාවිතය සඳහා විශාල මූලික පිරිවැයක් දැරීමට සිදුවේ |

SRI LANKA

*(ලකුණු 04)*

**(c)**

| ආයතනයේ නම | ආයතනයේ කාර්යභාරය |
|---|---|
| **ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය** | 1 පුහුණුව සහ මගපෙන්වීම තුළින් කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම.<br>2 ශ්‍රී ලංකාවේ පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන සඳහා වඩාත් ඵලදායී ලෙස සැලසුම් කොට ව්‍යාපාරික කටයුතු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම.<br>3 ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම |
| **ජාතික මෝස්තර මධ්‍යස්ථානය** | 1 නව නිර්මාණ තරග සංවිධානය කිරීම.<br>2 නව මෝස්තර/ කාර්මික සැලසුම් හඳුන්වා දීම.<br>3 අපනයන වෙළෙඳපොළට ඉදිරිපත් කළ හැකි නව නිර්මාණ හඳුන්වා දීම |

| | |
|---|---|
| **කාර්මික තාක්ෂණ ආයතනය** | 1 කර්මාන්ත සඳහා තාක්ෂණික උපදේශන සේවා සැපයීම.<br>2 තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>3 තොරතුරු මධ්‍යස්ථාන හරහා තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම. |
| **ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය** | 1 නව ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම<br>2 ඇසුරුම් ක්‍රම පිළිබඳ පාඨමාලා සංවිධානය කිරීම<br>3 ඇසුරුම්කරණයේ ඇති බාධක හඳුනාගෙන ඒවාට පිළියම් යොදන්න |
| **ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය** | 1 පාසල් හැර යන අය සඳහා විවිධ වෘත්තීය පාඨමාලා සංවිධානය කිරීම<br>2 විවිධ වෘත්තීන් සඳහා පුහුණු ශ්‍රමිකයින් අනුයුක්ත කිරීම තුළින් රැකියා අවස්ථා නිර්මාණය කිරීම<br>3 වෘත්තීන් පිළිබඳ සේවා ප්‍රමිති සකස් කිරීම |
| **ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය** | 1 කළමනාකරිත්ව සංවර්ධනය - රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කළමනාකරුවන් සහ අදාළ අධීක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම<br>2 කළමනාකරණ පර්යේෂණ පැවැත්වීම - අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ දත්ත රැස් කිරීම<br>3 පරිගණක සේවා - කොන්ත්‍රාත් ක්‍රමය යටතේ විවිධ ආයතන සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ පරිගණක වැඩසටහන් සකස් කිරීම |

SRI LANKA

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:*

***පරිච්ඡේදය 03 - ව්‍යාපාර උපකාරක සේවා***
***පරිච්ඡේදය 07 - ව්‍යවසායකත්වයේ දායකත්වය***

**(a) හොඳ ප්‍රවාහන පද්ධතියක ගුණාංග**

1 වේගය
2 ආරක්ෂාව
3 අඩු පිරිවැය
4 ධාරිතාව
5 සුලභතාවය
6 ප්‍රමිති හා අන්තර්ජාතික සම්මත
7 නෛතික පැවැත්ම

***(ලකුණු 03)***

**(b) බලපත්‍රලාභී වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා**

1 බැංකු අණකර නිකුත් කිරීම
2 චෙක්පත් උපලබ්ධි කිරීම / අයහපත් උපලබ්ධි කර දීම
3 ස්ථාවර නියෝග ඉටු කිරීම
4 ප්‍රේෂණ
5 ණයවර ලිපි නිකුත් කිරීම
6 කොටස් ප්‍රාරක්ෂණ
7 කල්බදු සේවා
8 විදේශ විනිමය මිලදී ගැනීම සහ විකිණීම
9 නියෝජිත සේවා
10 උකස් සේවා
11 දුරකථන බැංකු සේවා
12 අන්තර්ජාල බැංකුකරණය
13 බැංකු ණය

***(ලකුණු 03)***

**(c)**

ව්‍යවසායකත්වය යනු නව්‍යතා සම්පාදනය සහ අවදානම කළමනාකරණය කිරීම තුලින් මානව අවශ්‍යතා තෘප්තිමත් කිරීමේ සමස්ත ක්‍රියාවලියයි. මිනිස් අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක වන නිෂ්පාදනය, බෙදාහැරීම සහ ඒ ආශ්‍රිත සියලු ක්‍රියාකාරකම් ලෙස ව්‍යාපාර අර්ථ දැක්විය හැක. ව්‍යවසායකත්වය නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය තුළින් ව්‍යාපාර නිර්මාණය කරයි. ***ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා, ව්‍යවසායකයින් විසින් අවස්ථා හඳුනාගෙන ඒවා නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන සම්පාදනය කිරීම කළ යුතුය.*** එබැවින් මානව අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය සහ නවෝත්පාදන සැලසුම් කිරීමේදී ව්‍යවසායකත්වය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බව පැහැදිලිය. ව්‍යාපාර බොහෝ විට එම නවෝත්පාදනයන් වාණිජකරණය කරයි. ***කෙසේ වෙතත්, සියලුම ව්‍යාපාර ව්‍යවසායකයින් නොවන බව පැහැදිලිය, නමුත් සියලුම ව්‍යවසායකයින් ව්‍යාපාර නිර්මාණය කරයි.***

මෙයින් අදහස් කරන්නේ ව්‍යාපාරික ලෝකයේ ව්‍යාපාර සියල්ල ම ව්‍යවසායකත්ව ව්‍යාපාර නොවන බවත්, ඇරඹූ ව්‍යාපාර පවත්වාගෙන යමින් හෝ පවතින ව්‍යාපාර කටයුතුම සිදු කිරීමට වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කළ යුතු බවත්ය. කෙසේ වෙතත්, ඔවුන් සියල්ලන් ම ව්‍යවසායකයින් නොවන බවද ඔවුන් නව අවස්ථා නිර්මාණය කිරීම සහ නිර්මාණශීලීත්වය හෝ නව්‍යතා සම්පාදනයක් නොමැති වීමත් නිසා හුදු ව්‍යාපාර පමණි.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

***B කොටසෙහි අවසානය***

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**(a) ව්‍යාපාරයක් සදාචාරාත්මකව කරගෙන යාමේදී සළකා බැලිය යුතු කරුණු**

1. ව්‍යාපාරයේ ස්වභාවය
2. ව්‍යාපාරයේ හිමිකරුවන් කවුරුන්ද, ඔවුන්ගේ ආකල්ප, සංජානනයන්, ප්‍රතිමාන, වටිනාකම් යනාදිය.
3. ව්‍යාපාරයේ සේවකයින් කවුරුන්ද, ඔවුන්ගේ ආකල්ප, සංජානනයන්, ප්‍රතිමාන, වටිනාකම් යනාදිය.
4. පාරිභෝගිකයන් පිළිබඳ සැලකිල්ල යොමු කිරීම
5. තරගකරුවන් සහ ඔවුන්ගේ අභිප්‍රායන්
6. ව්‍යාපාරයේ සමාජ සංස්කෘතිය පිළිබඳ අවබෝධය
7. ආයතනික සංස්කෘතිය
8. ක්‍රියාත්මක කිරීමේ පිරිවැය

*(ලකුණු 03)*

**(b)**

**1. කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම**

C සොෆ්ට් හි නව තාක්ෂණය භාවිත කිරීම එහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලිය වේගවත් කරනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ක්‍රියාත්මක කරන ලද පරිගණක යෙදුමකට ස්වයංක්‍රීයව ඇණවුම් ලබා දෙන අතර, නිෂ්පාදනයේ සුමට ධාවනයක් අත්විඳිය හැකිය.

**2. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම**

නව තාක්ෂණය භාවිත කිරීම නිසා නිෂ්පාදන හා බෙදාහැරීමේ පිරිවැය අඩු කර සමාගමට වැඩි ලාභ ආන්තිකයක් ලබා ගැනීමට ඉඩ සලසයි.

**3. ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම**

නව තාක්ෂණය භාවිත කිරීම සමාගමට අමතර පිරිවැයකින් තොරව නව වෙළෙඳපොළ කොටස් වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට උපකාරී වේ. දත්ත පදනම් කරගත් යෙදුම් භාවිතයෙන් පහසු ගෙවීම් සහ වෙළෙඳපොළ හැසිරීම නිරීක්ෂණය කිරීම වෙළෙඳපොළ පර්යේෂණ සඳහාද පහසුකම් සපයයි.

**4. පරිසර හිතකාමී කළමනාකරණය කිරීම**

නව තාක්ෂණය භාවිත කිරීම මගින් සමාගමට අපද්‍රව්‍ය ඵලදායී, පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීමට ඉඩ සලසයි. උදාහරණයක් ලෙස සමාගම ඒ සඳහා ජල පවිත්‍රාගාරයක් ස්ථාපිත කර ඇත.

**5. මාර්ගගත ගනුදෙනු නිරීක්ෂණය කිරීමේ හැකියාව**

**6. ව්‍යාපාර සඳහා ජංගම යෙදුමක් සංවර්ධනය කිරීමේ හැකියාව**

**7. උසස් තත්ත්වයේ ඉක්මන් පාරිභෝගික සහාය සේවා සැපයීමේ හැකියාව**

*(ලකුණු 05)*

aat SRI LANKA

**(c)**

1. ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය භාවිතය (අපද්‍රව්‍ය පවිත්‍රාගාරය වැනි)
2. අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම (විශේෂයෙන්, රසායනික අපද්‍රව්‍ය සහ විද්‍යුත් අපද්‍රව්‍ය)
3. නියාමන බලධාරීන්ගෙන් යාවත්කාලීන උපදෙස් ලබා ගැනීම
4. පරිසර හිතකාමී හරිත නිෂ්පාදන සහ හරිත ඇසුරුම් වෙත ගමන් කිරීම
5. පරිසරයට හානි කරන ක්‍රියාකාරකම්වලින් වැළැක්වීම
6. පරිසරයට වන බලපෑම අවම කරන නිෂ්පාදන ක්‍රියාවලීන් සැලසුම් කිරීම
7. හරිත නිෂ්පාදන වෙත ගමන් කිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලියේදී හරිත ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
8. පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුම එක්රැස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. පැකේජ බැහැර කිරීමෙන් පසු පරිසරයට සිදුවන හානි වැළැක්වීම සඳහා පරිසර හිතකාමී ඇසුරුම් පද්ධතියක් භාවිතා කිරීම.
10. පරිසරය පිළිබඳ නියාමන සංවිධානවලින් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම.
11. ව්‍යාපාරයේ අවසාන ගිණුමට පරිසර වාර්තාවක් ඇතුළත් කිරීම.

*(ලකුණු 04)*

**(d)**

1. වේයන්ගොඩ ඔයෙන් මායිම් වූ වේයන්ගොඩ පිහිටා ඇති අක්කර 13 ක ඉඩම
2. නිශ්චිත සතියක පළතුරු අවශ්‍යතා දැක්වීමට පරිගණක යෙදුම
3. නිෂ්පාදන කම්හල
4. සේවකයින් (ශ්‍රමය)
5. ව්‍යවසායකත්වය

*(ලකුණු 03)*

**(e)**

"සමාජය" යන යෙදුම ඍජු ව්‍යාපාරික සබඳතාවක් නොවන සංවිධානයක් සමග සබඳතාවක් ඇති සියලු දෙනා ඇතුළත් කිරීමට ගත හැකිය. පොදුවේ ව්‍යාපාරය ක්‍රියාත්මක වන පරිසරය තුළ ඇති ව්‍යාපාරය සම්බන්ධයෙන් සැළකිලිමත් වන විවිධ පීඩන කණ්ඩායම් හා ඇල්මත් පාර්ශ්වයන් මෙයට ඇතුළත් වී ඇත.

සමස්තයක් ලෙස ගත් කළ ව්‍යාපාරය ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ප්‍රජාවන් මෙන්ම, විශේෂිත ව්‍යාපාර වර්ගය හෝ පොදුවේ පරිසරයට එහි ක්‍රියාකාරකම්වල බලපෑම සම්බන්ධයෙන් සැළකිලිමත් වන විවිධ ආකාරයේ පීඩන සහ පොලී කණ්ඩායම් ද මෙයට ඇතුළත් වේ. ප්‍රාදේශීය ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කළ, සංවිධානයේ සමස්ත ව්‍යාපාරික කාර්යසාධනය දේශීය රැකියාවට සහ සමෘද්ධියට බලපාන බැවින් උනන්දු වනු ඇත. බොහෝ කුඩා දේශීය ව්‍යාපාරවල සාර්ථකත්වය විශාල දේශීය ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම සහ සාර්ථකත්වයට සම්බන්ධ වීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, ප්‍රාදේශීය ප්‍රජාවට බලපාන දූෂණය, වාහන තදබදය වැනි ජීවන තත්ත්වය සම්බන්ධ වෙනත් ගැටලු තිබිය හැකිය.

C සොෆ්ට් සඳහා, සමාජය වැදගත් පාර්ශ්වකරුවෙකු ලෙස සැලකේ. ඇත්ත වශයෙන් ම, සමාජ රික්තකයක් තුළ කිසිදු ව්‍යාපාරයකට පැවතිය නොහැක. C සොෆ්ට් හා සම්බන්ධ සියලු ම සැපයුම්කරුවන්, බෙදාහරින්නන්, පාරිභෝගිකයින් සහ අනෙකුත් ආයතන සාමාන්‍ය සමාජයේ නියෝජිතයන් වේ. සමාජයෙන් යෙදවුම් ලබා ගෙන, සමාජයට නිමවුම් විකිණීම, සේවකයන් සමාජයෙන් ලබා ගෙන, සමාජයට අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කරනු ලබයි. එසේම සමාගම අවට ගම්මාන C සොෆ්ට් හි ව්‍යාපාරික මෙහෙයුම් සහ එහි අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වයි. එබැවින්, C සොෆ්ට් විසින් තම ව්‍යාපාරික මෙහෙයුම්වලදී පරිසරය, විශේෂයෙන්, ජල සම්පත සහ අවට ගම්වල මහජන යහපත ආරක්ෂා කිරීමට මූලිකත්වය ගත යුතුය.

*(ලකුණු 05)*

***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*